# සමරු කලාපය

# 2018
# ස්පර්ශනී

## යහපත් මාධ්‍ය සංස්කෘතියක් උදෙසා

## සන්නිවේදන හා මහජන සබඳතා උලෙළ

mass.comm
DEPARTMENT OF MASS COMMUNICATION

ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# දකුණේ චමත්කාරය රුහුණු සේවය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්මික බණ්ඩාර

ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන්විදුලි සේවය ලෙස රජරට සේවය ආරම්භ කිරීමෙන් පසුව එය පූර්වාදර්ශ කරගනිමින් ආරම්භ කළ දෙවන ප්‍රදේශීය ගුවන්විදුලි සේවාව වන්නේ රුහුණු සේවයයි. රුහුණු සේවයේ විකාශන කටයුතු නිල වශයෙන් ආරම්භ කරමින් එවක ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වූ තේවිස් ගුරුගේ මහතා

> *"ආයුබෝවන් වේලාව 3.30 යි. මේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ රුහුණු සේවයයි. ශ්‍රී බුද්ධ වර්ෂ 2523 වැන්නේ නවම් මස අවතිතියක නම් තිථිය ලත් රිවිදින හෙවත් ක්‍රිස්තු වර්ෂ 1980ක් වූ පෙබරවාරි මස 03 වැනි ඉරිදා ආරම්භ කරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ රුහුණු සේවයේ වැඩසටහන් විසුරුවා හරිනු ලබන්නේ වීරකැටියෙන් මීටර 505 හෙවත් කිලෝ හර්ට්ස් 594 ඔස්සේ ය."*

යනුවෙන් ප්‍රථම නිවේදනය නිකුත් කළේය. සැතපුම් 100 ක පමණ වපසරියක් ආවරණය වන පරිදි සිය විකාශන කටුයතු පවත්වාගෙන යාමට සැලසුම් කර තිබූ අතර ගුවන්විදුලි මැදිරි සංකීර්ණය මාතර මහ වීථියේ කුමාරතුංග මාවතේ නුපේ හවුස් මන්දිරය (යටත් විජිත යුගයේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ වාසස්ථානය හෙවත් රජගෙදර) තුළ ඉදිකරන ලදී. මෙම නව ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා මධ්‍යස්ථානය මාතර පිහිටුවීමට ප්‍රධාන වූයේ රුහුණු ප්‍රදේශයේ මධ්‍යස්ථානය මාතර වීමත්, ශ්‍රී ලංකා සාහිත්‍ය වංශ කථාවේ මාතර යුගය ලෙස පරිච්ඡේදයක් වෙන් වී තිබීමත් යන සාධකයන් ය.

ගාල්ල හා මාතර කේන්ද්‍රවෙමින් ගොඩනැගී තිබූ මෙම සාහිත්‍ය යුගය හේතුවෙන් රුහුණු පළාත තුළ වෙන ම සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති විය. ග්‍රාමීය පරිසරය, ගැමි සිරිත් විරිත්, ගැමි වහර, ගැමි විශ්වාසය, ග්‍රාමීය ආර්ථිකය හා අධ්‍යාපනය යනාදී සියලු ම අංශයන් හි රුහුණට ආවේණික බවක් මෙම යුගය තුළ ගොඩනැගෙන අයුරු පැහැදිලි වෙයි. වැලිවිට සංඝරාජ මාහිමිගෙන් පසුව සිටිනාමළුවේ ධම්මජෝති හිමි සහ වේහැල්ලේ ධම්මදින්න හිමි ආදී පඬිවරුන්ගේ සාහිත්‍ය භාවිතාවන්

රුහුණු සාහිත්‍ය යුගයේ දී හමුවන විශේෂතා වෙයි. මෙම විශේෂිත වූ අනන්‍යතා රටට ගෙනයාමේ වාහකයක් ලෙස රුහුණු ප්‍රාදේශීය සේවාව මාතර ස්ථාපිත වෙයි.

එමෙන්ම,

* කොළඹ ප්‍රධාන ගුවන්විදුලියට ප්‍රවේශ වීමේ දුෂ්කරතා
* රුහුණේ කරුණු කොළඹ ගුවන්විදුලියෙන් ප්‍රචාරය කෙරෙන විට ඊට ප්‍රතිචාර දැක්වීමට ක්‍රමයක් නොමැතිකම
* ප්‍රාදේශීය කලාකරුවන් කොළඹට ගොස් දක්ෂතා ඉදිරිපත් කිරීමට ඇති කුලැටිභාවය
* පාරිසරික සාධක
* අධික මුදල් ප්‍රමාණයක් වැයවීම
* ග්‍රාමීය ජනතාවට සමීප නොවීම

යනාදී සාධකයන් හේතුකොටගෙන රුහුණු ප්‍රාදේශීය සේවාව ආරම්භ කිරීමට තීරණය කෙරිණි.

මාතර පළාතේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය පණ්ඩිත දික්වැල්ලේ විමලතිස්ස හිමියන්

*"රුහුණේ පළපුරුදු උගතුන්ගෙන් දෙස රස බස හිඳැහිය පිළිබඳ ඔවදන් තෙවදන් පණවන් දෙසුම් අසන්නට ලැබෙතැයි සිතිය හැකිය. විවිධ සාහිත්‍ය, සංගීත කලා පිළිබඳ විශේෂ රසතැන් මතුවිය හැකිය. නිදා සිටි හැකියා ඇත්තන් අවදි කරවන රන් හොරණෑවක් විය හැකිය. ගැමි පරිසරයේ නන් වැදෑරුම් අත්දැකීම් එළිපෙහෙළි විය හැකිය. අගනුවරටම යා යුතු වැදගත් ගමන් රසක් මාතරට ගොස් කළ හැකි වනු ඇත." මෙහි කවර කවර උගත්තු වූ හු ද, වෙති ද, කවර කලා ශිල්ප වී ද, වේ ද, කවර තරමේ ආගමික ගොඩනැගිලි වේ ද, මෙයින් මතුවූ ජාතික ආගමික වීරයෝ කවරහුද, රණවීරයෝ, භාෂා වීරයෝ කවරහුද යනාදී විසිතුරු මුළු රටටම ලෙහෙසියෙන් එළිදරව් කිරීම සඳහා පහළ වූ රුහුණු ගුවන්විදුලි සේවාවේ මඟුල් මුල් පියවර ඇරඹෙන දිනය විද්‍යාමය දියුණුවේ මහිමයෙන් මේ පියසට දිවකන් ලැබුමක් සේ උදම් වන්නට කරුණු යෙදී ඇත."*

යනුවෙන් රුහුණු සේවය පිළිබඳ අදහස් දක්වයි.

රුහුණු ගුවන්විදුලියේ ප්‍රථම අධ්‍යක්ෂවරයා වශයෙන් ශ්‍රීපාලි වයමන් මහතා පත් විය. රුහුණු සේවය සඳහා ශිල්පීන් පුහුණු කරගන්නා තෙක් කොළඹ ජාතික ගුවන්විදුලියේ ශිල්පීන්ගේ සහය රුහුණු සේවා වැඩසටහන් නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇත. ප්‍රේමකීර්ති ද අල්විස්, ආරියසිරි විතානගේ, සුමනා ජයතිලක, බන්දුල විතානගේ යනාදී මාධ්‍යවේදීන්ගේ මැදිහත්වීමෙන් රුහුණු සේවා වැඩසටහන් සැකසුන අතර රුහුණේ සම්ප්‍රදායික ජන ජීවිතය හා සංස්කෘතිය යනාදිය වැඩසටහන් සඳහා වස්තුවිෂය බවට පත්වී ඇත.

රුහුණු ගුවන්විදුලියේ ප්‍රථම අධ්‍යක්ෂවරයා වූ ශ්‍රීපාලි වයමන් මහතාගෙන් පසුව හිල්ටන් පෙරේරා මහතා පත්විය. එම කාලය තුළ රුහුණු සේවය සඳහා අංග සම්පූර්ණ පහසුකම්වලින් සමන්විත පටිගත කිරීමේ මැදිරි දෙකකින් යුත් නව මැදිරි සංකීර්ණයක් 1982 පෙබරවාරි මස 22 දින විවෘත කර ඇත. හිල්ටන් පෙරේරා මහතාගෙන් පසුව, කේ.එස්. වික්‍රමරත්න මහතා, තිලක සුධර්මන් ද සිල්වා, කොල්වින් ජයවීර මහතා, එම්.පී. ගුණවර්ධන මහතා, පුෂ්පා ගුණතිලක මහත්මිය, සරත් කැල්ලපත මහතා, ධනුක

ගුණරත්න මහතා, විජේදාස මහතා, වීරසිංහ කරුණානායක මහතා, නීල් වීරතුංග මහතා යන අය රුහුණු සේවයේ අධ්‍යක්ෂ තනතුර සඳහා පත්වීම් ලබා ඇත.

රුහුණු සේවය ආරම්භ කිරීම පිළිබඳ එවක ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සභාපති ඒමන් කාරියකරවන මහතා ආරම්භක සමරු කලාපයට සිය අදහස් දක්වා සිටියේ මෙසේය.

> ''රුහුණු සේවය මගින් හෝ රජරට සේවය මගින් හෝ නව වැඩසටහන් හඳුන්වාදීමේදී වඩාත් ම තරුණ කොටස්වලට ගැළපෙන අයුරින් ක්‍රියාකිරීම, අත්‍යවශ්‍ය වෙයි. විවිධ වැඩසටහන්වලට වඩ වඩාත් තරුණ තරුණියන් සහභාගී කරවාගැනීමෙන් ද ඔවුන්ගේ රුචිකත්වයන් වටහාගෙන ඒ අයුරින් ක්‍රියාකිරීමෙන් ද මෙම අභිමතාර්ථය මුදුන්පත් කරගැනීමට හැකිවනු ඇත.''

ගුවන්විදුලි මාධ්‍ය ජනතාවගේ විශ්වාසය දිනාගත් ජාතික අවශ්‍යතාවන් සහ අරමුණු හඳුනාගත් ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව අවධාරණය කරන එවක රාජ්‍ය අමාත්‍ය ආනන්ද තිස්ස ද අල්විස් මහතා රුහුණු සේවයේ අනාගත කාර්යභාරය පිළිබඳ පැහැදිලි කරයි. ''රුහුණ ඉපැරණි සංස්කෘතියකට සහ ශිෂ්ටාචාරයකට හිමිකම් කියයි. ආදිතම සිංහලයාගේ ශ්‍රේෂ්ඨ වාරිකර්ම නිර්මාණයන් වන කුඩා සාගර බඳු වැව් වලින් සහ ඒවායේ ජලයෙන් සශ්‍රික වුණු නොපෙනෙන තෙක් මානයේ විහිදී ගිය රන්වන් කරලින් බර මහ කෙත් යායවල් සහ බොදු සිත්සතන් සැදැහැයෙන් අළලන මහ වෙහෙර විහාරයන්ගෙන් සැදි රුහුණු රට එදා සෞභාග්‍යයෙන් සහ ශ්‍රී විභූතියෙන් ඇළලී ගියේය.''

සිංහලයා පරසතුරන් අතට පත්වන්න ගිය හැම අවස්ථාවක පාහේ ම සතුරන් පරාජය කොට රට දැය සමය රැකගැනීමට පෙරමුණ ගෙන ක්‍රියාකාරී විය. පරසතුරන් අතින් වෙහෙර විහාර විනාශ වී ගිය විට බුදු දහම රැකුණේ රුහුණේ ය. ආක්‍රමණිකයන් හා සටන් වැදීමට ගිය වීර සෙබළුන්ට සහල් සැපයුණේ රුහුණේ අටුකොටුවලිනි. රුහුණේ මෙම ප්‍රෞඪ සම්ප්‍රදාය රැකගනිමින් විරෝදාර රුහුණු ජනතාවට ඉහළ ම රසවින්දනයක් ලබා දීම රුහුණු සේවයේ කාර්යභාරය හා අරමුණු බවට පත්වෙයි.

රුහුණේ සහ රුහුණු ජනතාවගේ සිතුම්පැතුම් මෙන්ම සමාජීය අපේක්ෂාවන්ට සරිලන අයුරින් ගුවන්විදුලි මාධ්‍ය සකස් කොට සංවර්ධන ක්‍රියාවලිය හා ජනතාව සම්බන්ධ කිරීම රුහුණු සේවයේ අපේක්ෂාව බවට පත්විය. ඒ අනුව රුහුණේ සංස්කෘතික ප්‍රබෝධය ඇතිකරලීමත්, චින්තනය ගොඩනැඟීමත් රුහුණු සංස්කෘතික දායාදයන් සංරක්ෂණය කිරීමේත් වගකීම රුහුණු සේවය වෙත පැවරෙයි. රුහුණු සේවයේ ආරම්භක අවස්ථාවේ එවක රාජ්‍ය ලේකම් සරත් අමුණුගම මහතාගේ පණිවිඩය වූයේ ''රුහුණ එදා සිටම ජාතියේ ජ්‍යෙෂ්ඨ පඬිවරුන් සහ සාහිත්‍යධරයන්ගේ නිජ බිම විය. ඔවුන්ගෙන් සිංහල සාහිත්‍යයට සහ භාෂාවට සිදු වූ සේවය ප්‍රමාණ කළ නොහැක. රුහුණට ම ආවේණික වූ කලා ශිල්ප බොහෝ ය. බලි තොවිල්, වෙස් මුහුණු සහ රූකඩ කලාව මේ අතර වෙයි. රුහුණේ මෙම සංස්කෘතිය රැකගැනීම සහ පෝෂණය කිරීම ද රුහුණු සේවය සතු ප්‍රධාන වගකීමක් බව කිව යුතුය. රටේ සංවර්ධනය උදෙසා පොදු ජනයා ඒකරාශී කරන අතර ම ඔවුන්ගේ රසවින්දනය අනුව කටයුතු කිරීමෙන් ඉතා සාර්ථක ප්‍රතිඵල ලබමින් රුහුණු සේවය පෙරටම ගමන් කරනු දැකීම අපගේ අභිලාෂයයි'' යන්නයි.

**රුහුණු සේවය සහ ශ්‍රාවක ආකර්ෂණය**

රුහුණු ප්‍රදේශයේ භූ පිහිටීම වෙරළාසන්න තැනිතලාව, උස්බිම්, මෙන්ම කඳු බිම්වලින් සමන්විත වෙයි. මාදුරු ඔය, වලවේ ගඟ, මැණික් ගඟ, කිරිඳි ගඟ, කුඹුක්කන් ගඟ, ගල් ඔය යනාදි ගංගාවන්ගෙන් පෝෂණය වන වී, තේ, පොල්, රබර්, කුරුඳු, ධීවර යනාදි කර්මාන්ත රුහුණු ප්‍රදේශයන්හී බහුලව ව්‍යාප්තව ඇත. එමෙන් ම කෝලම්, මහාසෝන් සමයම, රටයකුම, වන්නම්, ජන ක්‍රීඩා, කලූ කුමාර සමයම, සූනියම් ශාන්තිය, බලියාග යනාදී රුහුණේ ඉපැරණි සංස්කෘතිකාංග ජන ජීවිතයේ උපතේ සිට මරණය දක්වා බැඳී පවතී. එමෙන් ම කලාව, වෙදකම, නීතිය, මන්ත්‍ර ශාස්ත්‍රය, නැකැත් ශාස්ත්‍ර, වෙළඳාම, පරිපාලනය, අත්කම්, යනාදිය පිළිබඳ වැඩි උනන්දුවක් දක්වන ජනතාවක් රුහුණේ වාසය කරති. රුහුණු ගුවන් විදුලියේ ශ්‍රාවක ක්ෂේත්‍රය වන්නේ එවැනි වූ සංස්කෘතික, සමාජීය හා ආර්ථික ලක්ෂණවලින් යුත් ජන කණ්ඩායමකි. රුහුණ පුරා ව්‍යාප්තව සිටින නිර්මාණකරුවන් හා සංස්කෘතික වටිනාකම් සොයමින් ද ශ්‍රාවකයාගේ ශ්‍රවණ තත්ත්වය නංවාලීමට කටයුතු කරමින් ද රුහුණේ ජන ජීවිතය නගා සිටු වීමට උපකාර වන වැඩසටහන් රුහුණු සේවා ගුවන් කාලයට අන්තර්ගත විය.

> *"ගැමි සුවඳ විහිදෙන නවමු අත්දැකීම්, සුරුවිරුකම්, කලා කුසලතාවන්, ජීවන ගමනේදී මුහුණදෙන ගැටලු, විසඳුම්, රුහුණු ගුවන් තරංග ඔස්සේ වාතලයට මුසුවිය. ගිගිරි වළලු, රුහුණේ අප්‍රකට තොරතුරු, නුග සෙවන, යොවුන් පරපුර, ගමයි පන්සලයි, අපේ පාසැල, සිද්ධියක් තුළින්, රුහුණු සරසවිය ගැමි සුවඳ මුසුවන වැඩසටහන් අතර විය". (හේවගේ 2014. 48)*

රුහුණු සේවය සිය අසන්නන් බහුතරයක් සිටින ගාල්ල, මාතර, හම්බන්තොට වැනි දිස්ත්‍රික්ක වල ජනතාවට වඩාත් සමීප වීමේ දී වඩාත් සැලකිලිමත් වූ කරුණු කිහිපයක් පවතී.

1. රුහුණු සේවය හා සම්බන්ධ ග්‍රාහක කොටියාස හඳුනාගැනිම.
2. එසේ හඳුනාගත් ග්‍රාහක කොටියාස තුළ ගුවන්විදුලි මාධ්‍ය පිළිබඳ ඔවුන්ගේ අවශ්‍යතා අවබෝධ කරගැනීම.
3. එසේ හඳුනාගත් ගුවන්විදුලි මාධ්‍ය අවශ්‍යතා අනුව ග්‍රාමීය මට්ටමේ වැඩසටහන් සැලසුම් කිරීම හා එහි ක්‍රියාකාරීත්වය වඩාත් විධිමත් කිරීම.
4. සිය ශ්‍රාවක ජනතාවගේ ආකල්ප හා චර්යාමය මාධ්‍ය ප්‍රතිචාර හඳුනා ගැනීම.
5. සන්නිවේදනාත්මක ක්‍රියාවලියක් තුළින් සිය ශ්‍රාවකයා තම සමීප අත්දැකීම්කරුවෙකු බවට පත්කර ගැනීම. (කොඩිතුවක්කු 2003. 39)

රුහුණු සේවා වැඩසටහන් සිය ශ්‍රාවකයා ඉතා හොඳින් හඳුනාගෙන ඔවුන්ගේ විවිධ අවශ්‍යතා නියෝජනය වන ආකාරයෙන් ඉදිරිපත් කිරීම කාර්ය මණ්ඩලයේ අරමුණු බවට පත්වෙයි. "සංගීත, ළමා, කලා, ක්‍රීඩා ආදී හැම වැඩසටහනක් ම උසස් ප්‍රමිතියකින් ඉදිරිපත් කරන්න වග බලා ගන්නවා. උදෑසන විකාශයේ දී සවනක අද්දර, පුරා පැය 2ක් ඔස්සේ ගුවන් ගන්නා අසන්නන්ගේ ගීත ඉල්ලීම් ඒ වාගේ ම හැන්දෑ විකාශනයේ දී අපි පටන්ගන්නේ "මල් මල් වාරමේ" ළමා විචිත්‍රාංගයන්. ඉහළ ම ළමා සහභාගීත්වයක් ජනප්‍රියත්වයක් ඒ වැඩසටහන් ලබා තිබෙනවා." (වීරතුංග, 1998)

රුහුණු ගුවන්විදුලිය ආරම්භ වී පළමු දසකය තුළ රුහුණු ජනතාවට සමීප වෙමින් ප්‍රාදේශීය සේවා සංකල්පයේ මූලික අපේක්ෂාවන් මුදුන් පමුණුවා ගනිමින් කටයුතු කරන බව පැහැදිලි වෙයි. 1987 හම්බන්තොට සූරිය වැව හා පල්ලෙවෙල ප්‍රදේශ මූලික කරගනිමින් පවත්වන ලද ශ්‍රවණ සමීක්ෂණ මගින් රුහුණු සේවය පිළිබඳ ඉහළ විශ්වාසයක් හා ශ්‍රවණ තත්ත්වයක් ඇති බව තහවුරු කරගෙන ඇත. (කොඩිතුවක්කු 2003, 38)

වර්ෂ 1987 ජූලි 29 වෙනි දින රුහුණු සේවය කලහාකාරී පිරිසක් විසින් ගිනිබත් කළ අතර එතෙක් රුහුණු සේවය විසින් සංරක්ෂණය කොට ගොඩනගාගෙන තිබූ සම්පත් රැසක් එම ගින්නෙන් විනාශ විය. නමුත් ඉතා කෙටි කාලයකින් රුහුණු සේවා කටයුතු නැවත ආරම්භ කිරීමට කාර්ය මණ්ඩලය සමත් විය. රුහුණු සේවය සිය අනන්‍යතාව රැකගනිමින් ප්‍රාදේශීය සේවාවක මූලික ඉලක්කයන් සපුරමින් පැමිණි ගමන්මග පිළිබඳ රංජිත් සමරසූරිය මාධ්‍යවේදියා දැක්වූ අදහස රුහුණු සේවා කාර්යභාරය සංක්ෂිප්ත කොට දක්වන්නකි.

"ධීරත්වයෙන් හා වීරත්වයෙන් පිරිපුන්, දූ පුතුන්ගේ නිවහනක් වූ රුහුණු පුරවරය කවදත් වියතුන්ගේ හද බැඳි තක්ෂිලාවකි. එහි හරඹ දක්වන්නට භූමිකාවක් නොතිබූ යුගයක සමාරම්භ වූ රුහුණු සේවය ඔවුන් උදෙසා ම තැනුණු උත්තුංග වේදිකාවක් විය. මෙහි ප්‍රතිඵල විසින් ප්‍රාචීන ප්‍රතිචීන භාෂා ශාස්ත්‍රයන් හී හසළ බුද්ධිමත්හු ස්වීය පාණ්ඩිත්‍ය එළි දැක්වූහ. බස් විරුවෝ හෙළ බස පෙළ බස සංගායනා කළහ. කලා සුරුවෝ ප්‍රතිභාපූර්ණ කලා කෙත සරු කළහ. ලේඛකයෝ ලිපි සැරියට පණ පෙවූහ. කවි කිවිඳියෝ ශ්‍රාවකයන් වශී කළහ. කුසලතාපූර්ණ ගායකයෝ රොද පිටින් ජනහද බැඳගත්හ. ප්‍රාසාංගිකයෝ නවමු නිර්මාණ රටා මැවූහ. බලි තොවිල්කරුවෝ වේදිකාව අරක්ගත්හ. අත්කම්, ගෙත්තම්, සිත්තම් වර්ණවත් විය. ජනගායනා, ජන සංකල්පනා, ජනශ්‍රැතීන්ගෙන් දෙසවන් පිරී ගියේය. ගොවියාගේ, කම්කරුවාගේ දුබලයාගේ හඬ රැව් දෙන්නට විය. වෙදැදුරෝ දුහුනන් දැනුවත් කළහ. ශිෂ්‍යයෝ නොමසුරුව ගුරුමුෂ්ටි බෙදා දුන්නෝය. වෙලේ ඉපනැල්ලේ චමත්කාරය කියා පෑහ. ළද බොළඳ සිඟිත්තෝත්, වියත් දරු දැරියෝත් සිය දස්කම් ගුවනේ සිත්තම් කළහ. කඩේ පිළේ ගමේ ගොඩේ දුක් අඳෝනා දෝංකාර දෙන්නට විය. යතිවරු ධර්මය අධර්මය වදාළහ. බුදු දහම යළි ධර්මාසනාරූඪ විය. බණට පිරිතට පේ වී සිටියෝ උකටලීව දැහැන්ගත වූහ. මෙයින් රුහුණු සේවය මහා පෙළහරක්ම පෑවේය. දේශකයා, භාෂකයා, ලේඛකයා, ගායකයා, ගාන්ධර්වයා, නැණවත් විය, පණවත් විය, තෙදවත් විය, සවිමත් විය. රුහුණු සේවය ශ්‍රාවකයා පුෂ්ටිමත් කළේය. ශ්‍රාවකයා රුහුණු සේවය සන්තර්පනය කළේය. (හේවගේ 2014, 51).

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

හේවගේ. වී. (2004). *ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දෙවැනි ප්‍රාදේශීය සේවය රුහුණු සේවය*. හඬ ගුවන් විදුලි සඟරා. 2, 12, 47- 51.

කොඩිතුවක්කු, යූ. එච්., (2004). ලාංකීය ගුවන් විදුලියේ ප්‍රාදේශීය සේවා සංකල්පය. අප්‍රකාශිත නිබන්ධය. කැලණිය විශ්වවිද්‍යාලය.

වීරතුංග, එන්. (1998 පෙබ. 8). *රුහුණු සේවය දැන් අවුරුදු දහඅටක ඉළන්දාරියෙක්.* මීවිත පි.7

HSB 2012 තැටිය, තැටි පුස්තකාලය, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07.